# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2115/40 – 2019 මාර්තු 21 වැනි බ්‍රහස්පතින්ද – 2019.03.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිකහ දකුණු කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 1158, අස්සැද්දුම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අස්සැද්දුම (අ.ග.පි. 976) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක කේ්‍යු/කේපීඩබ්ලිව්/2018/124 හා 2018.05.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – තල්ගහමුලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1732

උතුරට: ටී. එම්. කේ. ඩී. තෙන්නකෝන් සහ තවත් අය හිමිකම් කියන තල්ගහමුලවත්ත සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: ජේ. ඒ. ඩී. ආර්. කුමාර හිමිකම් කියන තල්ගහමුලවත්ත, මාර්ගය සහ ඒ. එන්. රංමැණිකේ හිමිකම් කියන තල්ගහමුලවත්ත; බටහිරට: ඒ. එම්. සුනිල් අධිකාරී හිමිකම් කියන තල්ගහමුලවත්ත.

ගයන්ත කරුණාතිලක,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2017/පීසී/477.<br>
2019 පෙබරවාරි මස 08 වැනි දින,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,<br>
"මිහිකත මැදුර",<br>
අංක 1200/6,<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

04 - 125

1A – G29706 – 26(2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*